

ශ්‍රම වාසනා ශිෂ්‍යත්ව



ශ්‍රමයට අභිමන් විශිෂ්ඨ සේවා ඇගයීම්



සේවයෙන් පහ කල ඔබට
නීති ආධාර







වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
Annual Report
2018

ශ්‍රම වාසනා අරමුදල
சிரம வாசனா நிதியம்
Shrama Vasana Fund

පටුන	පිටුව
* මෙහෙවර හා දැක්ම	03
* ශ්‍රම වාසනා අරමුදලේ පාලන ව්‍යුහය	04
* 2018 වසර සඳහා සංවිධාන සටහන	05
* ශ්‍රම වාසනා අරමුදල හා එහි අරමුණු	06
* ශ්‍රම වාසනා අරමුදල සඳහා ලැබීම්	07
* ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය හා ලොතරැයි ආදායම	08
* ශ්‍රම වාසනා අරමුදලේ වැඩසටහන් සමාලෝචනය	09-18

ශ්‍රම වාසනා අරමුදලේ අවසාන ගිණුම් 2018

* ශේෂ පත්‍රය	20
* ආදායම් වියදම් ගිණුම	21
* ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය	22
* අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය	23
* ගිණුම් ප්‍රතිපත්තිය	24
* ගිණුම් වලට අදාල සටහන්	25-28
* අයවැය සංසන්දනය	29
* ශේෂ පිරික්සුම	30-31
* විගණකාධිපති වාර්තාව 2018	32-39

මෙහෙවර හා දැක්ම ...

දැක්ම (Vision)

"තෘප්තිමත් ශ්‍රම බලකායක්"

මෙහෙවර (Mission)

"කම්කරු ප්‍රජාවට සුභසාධනය සැපයීම හා විපතක දී පිහිටවීම සඳහා පවතින යාන්ත්‍රණයන්ගේ අඩුපාඩු පුරවමින් වඩා පොහොසත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා දායකත්වය සැපයීම"

පාලන ව්‍යුහය.....

1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින අතර එහි සභාපතීත්වය කම්කරු අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

ශ්‍රම වාසනා අරමුදල් පනතට අනුව අරමුදලේ පාලන කටයුතු පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති අතර අරමුදල කළමනාකරණය හා ඊට අදාල කටයුතු සියල්ලම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.

2017 අධ්‍යක්ෂ මණ්ඩලය - ශ්‍රම වාසනා අරමුදල

නම	තනතුර
එස්.ඒ.එන්. සරණතිස්ස.	සභාපති
ඒ.විමලවීර	සාමාජික
එම්.ජේ.ආර්.පුවිරාජ්	සාමාජික
ඩබ්.පී. අමරසිංහ	සාමාජික
එස්.එන්. සූරියකුමාර	සාමාජික
එස්.බී.යූ.එස්. මෛත්‍රීපාල	සාමාජික
ඩී.ආර්.ජයලත්	සාමාන්‍යාධිකාරී/ ශ්‍රම වාසනා අරමුදල

2018-12-31 දිනට සංවිධාන සටහන



ශ්‍රම වාසනා අරමුදලල **සහ එහි** අරමුණු.....

ශ්‍රම වාසනා අරමුදල

1998 අංක 12 දරණ පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු සුභ සාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල් පනතේ අරමුණු 6ක් ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභ සාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලංකීය සේවා නියුක්තිකයින්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත.

ශ්‍රම වාසනා අරමුදල වෙත ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ලබා දෙන දායකත්වය ජාතික සම්පත ලොතරැයි අලෙවියත් සමඟ ක්‍රම ක්‍රමයෙන් වැඩිවෙමින් පවතින අතර එම දායකත්වය වැඩිවීමත් සමඟ කම්කරු සුභ සාධනය උදෙසා සිදු කිරීමට නියමිත සේවාවන් ද මේ සමඟ වර්ධනය කර ඇත.ශ්‍රම වාසනා අරමුදල පෞද්ගලික අංශයේ සේවකයන් ආවරණය වන පරිදි පිහිටුවා ඇති අතර ස්වයං රැකියා කරනු ලබන පිරිස මෙමඟින් ආවරණය නොවේ. ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය ධාරිතාව මත විවිධ වැඩසටහන් එක් එක් සීමාවන් තුල ක්‍රියාත්මක කරනු ලැබේ. මූල්‍ය ධාරිතාව වැඩිවීමත් සමඟ එම සීමා වලින් ඔබ්බට තව දුරටත්සේවාවන් පුළුල් කිරීම වර්ෂයක් පාසා සිදු කරමින් පවතී.

විශේෂයෙන්ම මේ වනවිට ISO 9001-2015 ජාත්‍යන්තර තත්ත්ව සහතිකය ලබාගෙන ඇති ආයතනයක් වශයෙන් මෙසේ පුළුල් වන කාර්යයන් වලට සමගාමීව සේවක සේවිකාවන්ගේ දැනුම ආකල්ප හා කුසලතා යාවත්කාලීන කරමින් සැමවිටම කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සේවාලාභීන් වෙත ලබාදීමට ශ්‍රම වාසනා අරමුදල කටයුතු කරනු ලබයි.

ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු

(අ) සේවා නියුක්තිකයන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.

(ආ) සේවා නියුක්තයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක ඒ සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.

(ඇ) හදිසි අවස්ථා වලදී සේවා නියුක්තයන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.

(ඈ) සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.

(ඉ) ව්‍යසන අවස්ථා වලදී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් පහසුකම් සැපයීම.

(ඊ) සේවා නියුක්තිකයන්ගේ සුභ සාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

ශ්‍රම වාසනා අරමුදල සඳහා ලැබීම්

(අ) පාර්ලිමේන්තුව විසින් අරමුදලේ අරමුණු ඉටු කර ගැනීමේ කාර්යය සඳහා කලින් කළ සම්මත කරනු ලැබිය හැකි සියළු මුදල්

(ආ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ප්‍රධාන, ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියළුම මුදල්

(ඇ) අරමුදල මඟින් කරන ආයෝජන වලින් ආදායම වශයෙන් ලැබෙන මුදල්

(ඈ) 13 වන වගන්තියේ සඳහන් ලොතරැයි වලින් ලැබෙන මුදල් ද ඇතුළුව මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී සහ කර්තව්‍ය ඉටු කිරීමේදී අරමුදලට ලැබෙන සියළුම මුදල්

<u>ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය (රුපියල් මිලියන වලින්)</u>

	2014	2015	2016	2017	2018
අරමුදලේ වටිනාකම	331	369	326	388	408
අරමුදලේ වර්ධනය	39	38	-43	62	20



ලොතරැයි ආදායම් (රුපියල් මිලියන වලින්)

ආදායම	80.00				
ආදායම් වර්ධනය					



2018 වර්ෂයේ ශ්‍රම වාසනා අරමුදලේ වැඩසටහන් සමාලෝචනය.

ශ්‍රී ලංකාව තුල පැවති අභ්‍යන්තර ගැටුම් නිමවීමත් සමඟ වර්තමානයේ ඇති වී ඇති දේශපාලන ස්ථාවර භාවයත්, ශ්‍රී ලංකාව හා ජාත්‍යන්තර ප්‍රජාව අතර ඇති වී තිබෙන අන්තර් සම්බන්ධතා පුළුල් වීමත් හේතුකොට ගෙන රට තුළ ඇති වූ සාමකාමී වාතාවරණය හේතුවෙන් විදේශ ආයෝජන විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළ වර්ධනය වී ඇත.

මෙමඟින් ලංකාව තුළ වැඩි වැඩියෙන් කර්මාන්තශාලා ආරම්භ වීමත් එනිසාම වැඩි පිරිසකට රැකියා අවස්ථා හිමිවීමත් සිදු වූ අතර එම හේතු නිසා වර්තමානය වන විට ලංකාවේ ක්‍රියාකාරී ශ්‍රම බලකාය මිලියන 9ක් පමණ වේ.

මෙසේ වැඩිවන ශ්‍රම බලකාය ඉලක්ක කරමින් ශ්‍රම වාසනා අරමුදල විසින් විවිධ අරමුණු ඔස්සේ ක්‍රියාත්මක කරන වැඩසටහන් ප්‍රමාණය ද වසරින් වසර වැඩිකරමින් සේවක සුභ සාධනය ඉහළ නැංවීමට කටයුතු කරගෙන යනු ලබයි.

පෙර වර්ෂයන්ට සාපේක්ෂව 2018 වසර තුලදී ශ්‍රම වාසනා අරමුදලේ අරමුණුගත හා ඊට අනුශාංගික කාර්යයන්හි වර්ධනයක් පෙන්නුම් කරන අතර මේ සඳහා අරමුදලේ කාර්යය මණ්ඩලයේ වර්ධනය හා වර්තමානයට ගැලපෙන ලෙස පුහුණු වැඩසටහන් සඳහා ඔවුන් යොමුකිරීම හේතු විය.

2018 වර්ෂය වෙනුවෙන් ශ්‍රම වාසනා අරමුදල සිදුකරන ලද පහත සඳහන් කාර්යයන් වැදගත් වේ.

ශ්‍රමික ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්.

- ශ්‍රමික ප්‍රජාව දැනුවත්කිරීමේ වැඩසටහන් යටතේ ආරක්ෂාකාරී හා කාර්යක්ෂම ශ්‍රම බලකායක් ඇති කිරීමේ අරමුණින් වෘත්තීය අනතුරු අවම කරගැනීම පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි 2018 වසර තුළ සිදුකරන ලදී.

  එසේම සේවක සේවිකාවන්ගේ දැනුම, ආකල්ප, නායකත්ව කුසලතා වර්ධනය කරගැනීම හා වඩා යහපත් වැඩ පරිසරයක් ඇතිකර තෘප්තිමත් වැඩ පරිසරයන් ඇති කිරීමේ අරමුණ ඇතිව ආකල්ප සංවර්ධන වැඩසටහන් හා විශේෂයෙන් ම කම්කරු නීති හා අණපනත් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකරන ලදී.

❖ ශ්‍රම වාසනා දැනුවත් කිරීමේ වැඩසටහන 2018 ජනවාරි මස 19 වන දින - මාරවිල වෘත්තීය පුහුණු අධිකාරිය




❖ දැනුවත් කිරීමේ වැඩසටහන 2018 ජුනි මස 12 වන දින ආයෝජන ප්‍රවර්ධන කලාපය - ඒකල




සේවක සුභසාධනය උදෙසා වෛද්‍ය කදවුරු පැවැත්වීම.

- සේවක සේවිකාවන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් අක්ෂි ආබාධ සහිත සේවක සේවිකාවන් වෙනුවෙන් අක්ෂි කඳවුරු පවත්වා ඔවුන්ට ඇස් කණ්නාඩි ලබාදීමට කටයුතු කරන ලදී.

❖ ඇස් කණ්ණාඩි බෙදා දීම 2018 මාර්තු මස 05 වන දින පරකඩුව රබර් කර්මාන්තශාලාව - රත්නපුර





❖ අක්ෂි වෛද්‍ය කඳවුර 2018 ජූලි මස 11 වන දින - කළුතර





ශ්‍රමික පවුල් සවිබල ගැන්වීම.

- ශ්‍රමික පවුල් සවිබල ගැන්වීම හා එම පවුල් වල ආර්ථික තත්ත්වය නගා සිටුවීම සඳහා සවිබල ගැන්වීම් වැඩසටහන් පැවැත්වීම.

❖ සවිබල ගැන්වීමේ වැඩසටහන 2018 අප්‍රේල් මස 26 වන දින - කුරුණෑගල









❖ සවිබල ගැන්වීමේ වැඩසටහන 2018 ජූලි මස 13 වන දින - අනුරාධපුර





ශ්‍රමික පවුල්වල දු දරුවන්ට පාසල් පොත් පත් ලබාදීම.

- ආර්ථික අපහසුතා වලින් පෙලෙන වැඩකරන ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ අරමුණ ඇතිව ඔවුන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් පාසල් උපකරණ හා පොත් පත් ලබාදීම සිදුකරන ලදී.

❖ පාසල් උපකරණ බෙදා දීම 2018 මාර්තු මස 19 වන දින තවලම ජාතික පාසල ගාල්ල




❖ පාසල් උපකරණ බෙදා දීමේ වැඩසටහන 2018 සැප්තැම්බර් මස 07 වන දින -යාපනය




ශ්‍රම වාසනා ශිෂ්‍යත්ව ලබා දීම.

- හදිසි ව්‍යසන අවස්ථාවලදී සේවා නියුක්තිකයන්ට හා ඔවුන්ගේ යැපෙන්නන් වෙනුවෙන් මුල්‍යමය හා වෙනත් සහන ලබා දීම යටතේ වෘත්තීය අනතුරු හේතුවෙන් මියගිය හෝ පූර්ණ දුබලතාවයට පත් වූ සේවා නියුක්තිකයන්ගේ අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් ශ්‍රම වාසනා ශිෂ්‍යත්ව ලබා දීම වාර්ෂික ව සිදු කරනු ලබයි.

❖ ශ්‍රම වාසනා ශිෂ්‍යත්ව වැඩසටහන 2018 මාර්තු මස 28 වන දින ශ්‍රම වාසනා අරමුදල




❖ වෘත්තීය අනතුරු හේතුවෙන් මියගිය හෝ පූර්ණ දුබලතාවයට පත් දෙමාපියන්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානයට සමගාමීව පැවැත්වූ දානමය පුණ්‍ය කර්මය 2018 මාර්තු මස 28.




සේවකයින් වෙනුවෙන් වෛද්‍ය සායන.

❖ බෝනොවන රෝග පිළිබඳ වෛද්‍ය සායනය හා දැනුවත් කිරීමේ වැඩසටහන 2018 මාර්තු මස 29 වන දින අපනයන සැකසුම් කලාපය - කුණ්ඩසාලේ.





විවිධ සුබසාධන වැඩසටහන්.

ඉහතින් දක්වා ඇති වැඩසටහන් වලට අමතරව 2018 වසර සඳහා ශ්‍රම වාසනා අරමුදල විසින් සිදු කරන ලද වැඩසටහන් පහත සඳහන් කර ඇත.

- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 ජනවාරි මස 29 වන දින - අනුරාධපුර කම්කරු කාර්යාලය.
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 මාර්තු මස 08 වන දින කම්කරු කාර්යාලය - කුලියාපිටිය
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 මාර්තු මස 12 වන දින Thalawakale Plantation - හැටන්
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 මාර්තු මස 12 වන දින ගල්පඩිතැන්න රබර් කර්මාන්තශාලාව - රත්නපුර
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 මාර්තු මස 13 වන දින Madolseema Plantation - හැටන්
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 මාර්තු මස 26 වන දින කම්කරු දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරය - නාරාහේන්පිට
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 මැයි මස 10 වන දින Ma's Food Lanka ltd. ආයතනය - යාපනය
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 මැයි මස 10 වන දින Thawam Engineering ආයතනය - යාපනය
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 මැයි මස 11 වන දින Mas Active Kreeda ආයතනය - කිලිනොච්චිය
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 මැයි මස 11 වන දින Puthuwasam Garment ආයතනය - මුලතිව්
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 මැයි මස 16 වන දින රාස්සගල තේ කර්මාන්තශාලාව - බලංගොඩ.
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 මැයි මස 16 වන දින මැදකන්ද තේ කර්මාන්තශාලාව - බලංගොඩ
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 ජූනි මස 07 වන දින ලංකා ගමනාගමන මණ්ඩලය - අනුරාධපුරය.
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 ජූලි මස 02 වන දින -ගම්පහ
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 ජූලි මස 04 වන දින -රක්වාන
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 නොවැම්බර් මස 26 වන දින සමුපකාර සමිති ශාලාව - කොටපොල
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 ජූලි මස 23 වන දින - රත්මලාන
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 අගෝස්තු මස 30 වන දින රාජ්‍ය දැව සංස්ථාව - බදුල්ල
- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 අගෝස්තු මස 30 වන දින ලකී ලෑන්ඩ් තේ කර්මාන්තශාලාව - බදුල්ල.

- දැනුවත් කිරීමේ වැඩසටහන 2018 අගෝස්තු මස 31 වන දින හොප්ටන් තේ කර්මාන්තශාලාව - පස්සර

- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන 2018 අගෝස්තු මස 31 වන දින වේවැස්ස තේ කර්මාන්තශාලාව හා යූරි තේ කර්මාන්තශාලාව- පස්සර
- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන 2018 සැප්තැම්බර් මස 05 වන දින අම්පාර
- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන 2018 අගෝස්තු මස 08 වන දින හෙල කැෂුවල් ආයතනය - මාතලේ
- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන 2018 අගෝස්තු මස 09 වන දින හයිඩ්‍රාමනි ආයතනය - කහතුඩුව
- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන -දඹුල්ල 2018 ඔක්තෝම්බර් මස 09 දින Maliban Dairy & Agri Products (pvt)ltd හා ක්‍රිස්ටල් මාර්ටින් ආයතනය - දඹුල්ල
- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන - බස්නාහිර කලාප II 2018 ඔක්තෝම්බර් මස 12 වන දින K&D Manufacturing සමාගම හා Hydramani GMT Factory ආයතනය
- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන 2018 සැප්තැම්බර් මස 22 වන දින ගෝල්ඩන් බඩ්ස් තේ කර්මාන්තශාලාව - බදුල්ල
- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන 2018 නොවැම්බර් මස 29 වන දින ආයෝජන කලාපය - බියගම
- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන 2018 නොවැම්බර් මස 30 වන දින Concourd Apparel - තඹුත්තේගම
- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන 2018 නොවැම්බර් මස 30 වන දින Vin Plastic ආයතනය - කුරුණෑගල
- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන 2018 ඔක්තෝම්බර් මස 18 දින හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමුහ පුද්ගලික සමාගම, මිරිජ්ජවිල හා Triples Supply (pvt) ltd, Hambanthota.
- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන 2018 දෙසැම්බර් මස 28 වන දින හැඩිගල්ල තේ කර්මාන්තශාලාව .මෝල්කාව
- ❖ අක්ෂි වෛද්‍ය කඳවුර 2018 අගෝස්තු මස 09 වන දින - හැටන්
- ❖ අක්ෂි වෛද්‍ය කඳවුර 2018 අගෝස්තු මස 30 වන දින - අනුරාධපුර
- ❖ අක්ෂි වෛද්‍ය කඳවුර 2018 සැප්තැම්බර් මස 05 වන දින - මඩකලපුව
- ❖ අක්ෂි වෛද්‍ය කඳවුර 2018 ජූලි මස 26 වන දින - කිලිනොච්චිය
- ❖ අක්ෂි වෛද්‍ය කඳවුර 2018 සැප්තැම්බර් මස 14 වන දින - වැලිමඩ
- ❖ අක්ෂි වෛද්‍ය කඳවුර 2018 සැප්තැම්බර් මස 15 වන දින - හපුතලේ
- ❖ අක්ෂි වෛද්‍ය කඳවුර - දෙනියාය 2018 ඔක්තෝබර් මස 13 දින සමූපකාර ශාලාව
- ❖ අක්ෂි වෛද්‍ය කඳවුර 2018 ඔක්තෝබර් මස 23 දින දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය - කුරුණෑගල
- ❖ පාසල් උපකරණ බෙදා දීම 2018 මාර්තු මස 10 වන දින මාතලේ මිල්ලවාන මහා විද්‍යාලය

- පාසල් උපකරණ බෙදා දීම 2018 මාර්තු මස 07 වන දින කම්කරු කාර්යාලය - කළුතර
- ලෝක වකුගඩු දිනය සැමරීමේ ජාතික වැඩසටහනට සමගාමීව පාසල් උපකරණ කට්ටල බෙදා දීම - 2018 මාර්තු මස 08 වන දින බුත්තල යුධ හමුදා කඳවුර
- පාසල් උපකරණ බෙදා දීමේ වැඩසටහන 2018 අප්‍රේල් මස 09 වන දින දෙමළ මහා විද්‍යාලය - පුස්සැල්ල
- 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය 2018 ජූනි 09 වන දින - ආණමඩුව
- 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය 2018 ජූනි 23 වන දින -පුත්තලම
- 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය 2018 ජූනි 23 වන දින - පුත්තලම
- 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය 2018 ජූනි 23 දින - හම්බන්තොට
- 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය 2018 ජූලි 07 වන දින - අනුරාධපුර
- 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය 2018 ජූලි 27 වැලිමඩ (සිංහල මාධ්‍ය)
- 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය 2018 ජූලි Z7 පස්සර (දෙමළ මාධ්‍ය)
- ශිෂ්‍යත්ව වැඩසටහන හා වෙබ් අඩවිය එළි දැක්වීම 2018 සැප්තැම්බර් මස 25 වන දින කම්කරු මහ ලේකම් කාර්යාලය
- සවිබල ගැන්වීමේ වැඩසටහන 2018 සැප්තැම්බර් 07 වන දින -යාපනය
- ජංගම සේවයට සමගාමීව සවිබල ගැන්වීමේ වැඩසටහන සැප්තැම්බර් මස 22 වන දින බදුල්ල
- ජංගම සේවයට සමගාමීව පාසල් උපකරණ බෙදා දීමේ වැඩසටහන සැප්තැම්බර් මස 22 වන දින බදුල්ල
- සවිබල ගැන්වීමේ වැඩසටහන 2018 සැප්තැම්බර් 29 වන දින- රත්නපුර
- ශ්‍රම වාසනා අරමුදලේ නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධන වැඩසටහන 2018 දෙසැම්බර් මස 28 වන දින ලක්සිරි හෝටලය - මතුගම.

Shrama Vasana Fund

2018
Final Accounts

Ministry of Labourand Trade Union Relations

Final Account 2018

"Shrama Vasana Fund"No 97, Jawaththa Road, Colombo 05

Shrama Vasana Fund

Shrama Vasana Fund
Statement of Financial Position
as at December 31st ,2018

		Rs. 2018	Rs. 2017
Assets			
Current Assets			
Cash and Cash Equivalents		1,731,446.25	557,562.28
Inventories	**Note 04**	2,439,264.83	3,420,376.93
Deposit in Postal Machine		13,535.00	24,695.00
Pre-payment Insuarance		-	296,043.94
Investment in Fixed Deposit		107,000,000.00	-
Receivables	**Note 03**	306,420,669.22	298,007,797.69
		417,604,915.30	302,306,475.84
Non-Current Assets			
Investment in Fixed Deposit		-	103,000,000.00
Investment in ISO & Web site ,Web Base System		2,745,258.00	2,060,258.00
Research & Development		-	295,175.00
Software Development		-	549,000.00
Staff Training		-	225,490.00
Intangible asset	**Note 02**	23,269.18	33,000.00
Plant Machinary & Equipment	**Note 01**	11,068,431.62	11,578,761.63
		13,836,958.80	117,741,684.63
Total Assets		431,441,874.10	420,048,160.47
Liabilities			
Current Liabilities			
Payables	**Note 06**	1,172,392.18	2,764,013.25
Provission	**Note 07**	1,333,116.00	5,924,524.38
Total liabitilies		2,505,508.18	8,688,537.63
Net Assets		428,936,365.92	411,359,622.84
Accumulated Surpuls	**Note 05**	428,936,365.92	411,359,622.84
Total net Assets		428,936,365.92	411,359,622.84

The Accounting Policies and notes on pages 06 to 10 from an integral part of this financial statement.The Board of Directors of an entity is responsible for the preparation and presentation of these Financial Statements in accordance with the Sri lanka public sector Accounting Standards(SLPSAs).These financial statements were approved by the Board of Directors and signed on their behalf.

R.P.R.Rajapaksha	H.M.P.C.Kumarihami	D.R.Jayalath	M.Lakmini Jayamali
Chairman	Director	General Manager	Accountant
ShramaVasana Fund	ShramaVasana Fund	ShramaVasana Fund	ShramaVasana Fund

Final Account 2018

"Shrama Vasana Fund"No 97, Jawaththa Road, Colombo 05

R. P. R. Rajapaksa
Secretary
Ministry of Labour and Trade Union Relations
Labour Secretariat
Narahenpita, Colombo 05.

අධ්‍යක්ෂ
කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

D. R. Jayalath
Shrama Vasana Fund
Ministry of
Labour & Labour Relations

M. LAKMINI JAYAMALI
Accountant
Shrama Vasana Fund
Ministry of
Labour & Labour Relations

Shrama Vasana Fund
Statement of Financial Performance
As at December 31st ,2018

		Rs. 2018	Rs. 2017
Revenue			
Income	**Note 09**	63,241,723.15	57,959,053.10
Total Revenue		63,241,723.15	57,959,053.10
Expenses			
Administration Expences	**Note 10**	13,931,486.84	12,609,705.20
Depreciation	**Note 11**	2,000,515.06	2,015,263.64
Expenditure for objective of fund	**Note 12**	28,071,637.74	30,178,504.91
		44,003,639.64	44,803,473.75
Surplus for Year		19,238,083.51	13,155,579.35

Shrama Vasana Fund

4

Shrama Vasana Fund
Statement of Changes in Funds
For the Year Ended December 31, 2018

	Accumulated Fund	Total
Balance as at 31st December 2016	398,204,043.49	398,204,043.49
Surplus for the year	13,155,579.35	13,155,579.35
Balance as at 31st December 2017	411,359,622.84	411,359,622.84
Prior year adjestment	(1,661,340.43)	(1,661,340.43)
Surplus for the year	19,238,083.51	19,238,083.51
Balance as at 31st December 2018	**428,936,365.92**	**428,936,365.92**

Shrama Vasana Fund
Cash flow Statement
For the Year Ended December 31, 2018

		Rs. 2018	Rs. 2017
CASH FLOWS FROM OPERATING ACTIVITIES			
Surplus for year	*Note 13*	17,576,743.08	13,155,579.35
Non-cash movements			
Depreciation		2,000,515.06	2,015,263.64
Revalue loss/Profit		(157,154.23)	-
Increment of other payables		(1,591,621.07)	1,456,781.71
Increment of Provission		(4,591,408.38)	5,924,524.38
Investment Interest		(11,104,892.32)	(11,778,989.61)
Distress Loan Interest		(34,996.90)	(16,697.32)
Repo investment interest		(110,766.23)	(90,136.99)
Other income		(224,347.70)	(34,690.00)
(Increase)/Decrease of other receivables		(8,412,871.53)	28,488,837.81
(Increase)/Decrease in Inventories		981,112.10	(1,340,843.77)
Net cash flows from operating activities		(5,669,688.12)	37,779,629.20
CASH FLOWS FROM INVESTING ACTIVITIES			
Purchasing of Plant,Machinary & equipment		(1,323,300.00)	(1,106,259.57)
Investment Interest		11,104,892.32	11,778,989.61
Distress Loan Interest		34,996.90	16,697.32
Repo investment interest		110,766.23	90,136.99
Other income		224,347.70	34,690.00
Deposit Postal Machine & Insurance		307,203.94	(108,752.96)
Investment of Web Base & ISO		(685,000.00)	(1,214,629.00)
Research & Development		295,175.00	(295,175.00)
Software Development		549,000.00	(549,000.00)
Staff Trainng		225,490.00	(225,490.00)
Investment Fixed Deposit		(4,000,000.00)	(51,000,000.00)
Net cash flows from investing activities		6,843,572.09	(42,578,792.61)
Net increase/(decrease)in cash and cash equivalents		1,173,883.97	(4,799,163.41)
Cash and cash Equivalants at beginning of period		557,562.28	5,356,725.69
Cash and cash Equivalants at end of period		1,731,446.25	557,562.28

SHRAMA VASANA FUND
Statement of Accounting Policies

1. Significant Accounting Policies

1.1 General Policies

1.1.1 Reporting Entity

SHRAMA VASANA FUND is incorporated by Shrama Vasana Fund Act, No.12 Of 1998.

1.1.2 Date of Authorization for issue
The Financial Statements were authorized for issue by the Board of Directors on 27th February 2019.

1.1.4 Basis of Preparation

a) Statement of Compliance

The financial statement comply with Sri Lanka Public Sector Accounting Standards for the accrual basis of Accounting.

b) Basic of Measurement
The Financial statements have been prepared on historical cost basis adjusted for revaluations of assets. Inventories has been measurement on weight average cost.

c) Use of Estimates and Judgements
The financial statements have been prepared on a going concern basis and the accounting policies have been applied consistently throughout the period.

Note 01
Plant machinary & Equipment
01-1

Cost	Restated balance as at 01.01.2018	Additions	Disposal/write off/Adjestment	Balance as at 31.12.2018
Vechicle	9,396,860.00		14,360.00	9,382,500.00
Machinary & Equipment	765,693.95		253,313.95	512,380.00
Audio & Video Visual	995,653.00		301,269.00	694,384.00
Air Conditioners	1,279,824.99			1,279,824.99
Computers	2,621,401.50	1,300,800.00	1,266,404.00	2,655,797.50
Furniture and Fittings	1,527,445.87			1,527,445.87
Office Equipment	344,020.57		6,795.00	337,225.57
	16,930,899.88	1,300,800.00	1,842,141.95	16,389,557.93

01-02

Depreciation	Restated balance as at 01.01.2018	Charge for the period	Disposal/write off/Adjestment	Balance as at 31.12.2018
Vechicle	921,620.00	923,900.00	14,360.00	1,831,160.00
Machinary & Equipment	478,500.60	84,304.00	253,313.95	309,490.65
Audio & Video Visual	331,845.91	145,121.34	267,497.00	209,470.25
Air Conditioners	999,960.19	255,965.00	-	1,255,925.19
Computers	1,837,284.09	403,440.23	1,274,337.00	966,387.32
Furniture and Fittings	436,677.41	152,444.59	-	589,122.00
Office Equipment	134,550.05	26,101.54	1,080.69	159,570.90
	5,140,438.25	1,991,276.70	1,810,588.64	5,321,126.31

Note 02

Intangible Asset	Cost as at 01.01.2018	Additions	Balance as at 31.12.2018
Soft Ware	33,000.00	22,500.00	55,500.00
	33,000.00	22,500.00	55,500.00

Amortisation	as at 01.12.2018	Charge for the period	Balance as at 31.12.2018
Soft Ware	22,992.46	9,238.36	32,230.82

Note 03
Other Receivables

Treasary Operation Department	301,884,780.18
Festival Advance	11,750.00
Distress Loan	1,022,050.00
Interest on Fixed Deposit Investment	3,499,089.04
Refundable deposit	3,000.00
	306,420,669.22

Note 04
Inventories

Stationary	560,090.67
Programe Item	1,879,174.16
	2,439,264.83

Inventories has been measurement on Weighted Average Cost

Note 05

Cumulative Fund as at 01.01.2018	409,698,282.41
Surplus for the year 2018	19,238,083.51
Cumulative Fund as at 31.12.2018	428,936,365.92

Note 06
Other payable

Welfare programe payable	477,072.00
Empowenment Pro.Payable	22,202.00
Health camp Payable	19,000.00
Scholersip pro.Payable	283,353.21
Telephone Payable	26,345.30
Advertising & Promotion Payable	12,075.00
Other Payable	48,550.42
Stationary Payable	4,000.00
Retaintion 5%	62,165.00
water & electricity Payable	15,053.45
Over Time Payble	16,275.80
Audit Fee Payable	186,300.00
	1,172,392.18

Note 07
Provission

Provision for Legal Aid	335,000.00
Staff Gratuity Provission	608,116.00
Provision for web base system	390,000.00
	1,333,116.00

Note 08
Fixed Assets has been depreciated on Straight line basis
Following Rates are used.

Vehicle	10%
Machinary & Equipment	20%
Air Conditioners	20%
Audio & Video Visual	25%
Computers	25%
Furniture and Fittings	10%
Office Equipment	7.5%
Soft ware	20%

Depreciable value of final assets have been depreciated up to scrap value Rs.1

Note 09
Income

Shrama vasana Lottery Income	51,766,720.00
Fixed Deposit Investment Income	11,104,892.32
Distress Loan Interest Income	34,996.90
Repo Investment Income	110,766.23
Other Income	224,347.70
	63,241,723.15

Note 10
Administrative Expenditure

Salary & wages	5,201,661.76
E.P.F.	1,431,472.15
E.T.F.	214,720.82
Cost of Living Allowance	1,394,690.32
Other Allowance	222,040.00
Chairman Allowance	209,274.00
Practical trainee Allowance	235,000.00
Directors Allowance	518,000.00
Board Secreatary Allowance	6,000.00
Allowance for Internal Auditor	60,000.00
Professional Allowance	132,000.00
Staff Gratuity	608,116.00
Overtime & Holiday pay	463,726.59
Domestic Travelling & Sub	143,973.50
Transport Charges	26,425.00
Fuel	67,426.00
Stationery & Others	471,405.85
Postal Expenses	50,974.99
Telephone Expenses	273,991.76
Entertainment Expenses	84,975.50
Refreshment & Other	192,933.00
Sundry	25,354.00
Others	46,392.19
Audit Expenses	245,000.00
Water & Electricity	102,467.16
Other Service	432,658.89
Maintance & Repair expence	477,463.00
Staff Welfare	295,594.36
Training of Staff	297,750.00
	13,931,486.84

Note 11
Depreciation

Depreciation on Vehicle	923,900.00
Depreciation on Computers	403,440.23
Depreciation on Air Conditioners	255,965.00
Depreciation on Audio & Video Visual	145,121.34
Depreciation on Furniture and Fittings	152,444.59
Depreciation on Office Equipment	26,101.54
Depreciation on Machinary & Equipment	84,304.00
Amortisation on Soft ware	9,238.36
	2,000,515.06

Note 12
Expenditure to achive targets of the fund

Health camp Programme	4,965,408.89
Empowerment programme	2,284,659.66
Awarness Programme	1,168,907.00
Welfare programme	7,874,648.37
Artificial Legs & Limbs Programe	2,479,803.00
Technical education programme	10,000.00
Medical Assistance Programme	212,147.50
Legal Aid Programme	311,923.52
Legal assistance for appeals	90,000.00
Scholarship programme	3,891,722.49
Award Ceremony Programme	1,696,079.71
Lottery Sale Public Awarness	2,723,050.20
Productivity impro.appraisal	363,287.40
	28,071,637.74

Note 13

Surplus for year 2018	19,238,083.51
Prior year adjestment	(1,661,340.43)
Surplus for year 2018 (Cash Flow)	17,576,743.08

Note 14
Comparative Information
Prior years figures have been restated where necessary to confirm to the current year's presentation.

Note 15
Directors Interests in Contracts
No Director of the Board has any material direct or indirect interest in the contracts of the Board.

Note 16
Directors Responsibility
The Directors take responsibility for the Preparation and Presentation of Financial Statements.

Final Account 2018

"Shrama Vasana Fund"No 97, Jawaththa Road, Colombo 05

Shrama Vasana Fund
Comparison of Budget 2018
For the year December 31,2018

	Actual Amount	Budget Amount
Administrative Expenditure		
Salary & wages	5,201,661.76	7,000,000.00
E.P.F.12%	1,431,472.15	
E.T.F.	214,720.82	
Salary Allowance	222,040.00	3,500,000.00
Practical trainee Allowance	235,000.00	
Cost of Living Allowance	1,394,690.32	
Chairman Allowance	209,274.00	
Director board Allowance	518,000.00	
Board Secreatary Allowance	6,000.00	
Allowance for Internal Auditor	60,000.00	
Professional Allowance	132,000.00	
Bonus	-	
Staff Welfare & staff Loan	295,594.36	300,000.00
Overtime & Holiday pay	463,726.59	500,000.00
Staff Gratuity	608,116.00	650,000.00
Maintance & Repair expence	477,463.00	950,000.00
Postal & Communication	273,991.76	300,000.00
Water & Electricity	102,467.16	200,000.00
Transport Charges	26,425.00	400,000.00
Other Service	677,658.89	700,000.00
Others	315,654.18	500,000.00
Domestic Travelling & Sub	143,973.50	200,000.00
Stationery & Others	471,405.85	500,000.00
Training of Staff	297,750.00	500,000.00
	13,481,335.34	**15,700,000.00**
Expenditure to achive targets of the fund		
Promote the welfare of employees		
Health camp Programme	4,965,408.89	5,000,000.00
Empowerment programme	2,284,659.66	2,500,000.00
Awarness Programme	1,168,907.00	1,290,000.00
Welfare programme	7,874,648.37	8,040,000.00
Artificial Legs & Limbs Programe	2,479,803.00	3,500,000.00
Technical education programme	10,000.00	360,000.00
Medical Assistance Programme	212,147.50	250,000.00
Legal Aid Programme	311,923.52	1,000,000.00
Legal assistance for appeals	90,000.00	250,000.00
Scholarship programme	3,891,722.49	6,000,000.00
Award Ceremony Programme	1,696,079.71	2,300,000.00
Lottery Sale Public Awarness	2,723,050.20	3,200,000.00
Productivity impro.appraisal	363,287.40	800,000.00
	28,071,637.74	34,490,000.00
Plant machinary & Equipment		
Computers	748,000.00	820,000.00
	748,000.00	820,000.00
Other Capital Expenditure		
Investment in ISO & Web Base System	685,000.00	900,000.00
Software Development	22,500.00	30,000.00
	707,500.00	930,000.00

Shrama Vasana Fund 13

As at 31st December 2018

Trail Balance	**Dr.**	**Cr.**
Bank	1,731,446.25	
Fixed Deposit Investment	107,000,000.00	
Inventories-	2,439,264.83	
Stationary		
Programe Item		
Deposit Insuarance		
Investment of ISO Certificate	762,608.00	
Investment of Web base system	1,982,650.00	
Deposit postal Machine	13,535.00	
T.O.D.Receivable	301,884,780.18	
Fixed Deposit Interest receivable	3,499,089.04	
Refundable Deposit	3,000.00	
Distress Loan	1,022,050.00	
Festival Advance	11,750.00	
Vehicle	9,382,500.00	
Furniture & Fittings	1,527,445.87	
Intangible asset-Accounting package	55,500.00	
Audio & Video Visual	694,384.00	
Machinary & Equipments	512,380.00	
Airconditioners	1,279,824.99	
Computers	2,655,797.50	
Office Equipment	337,225.57	
Accumulated Depreciation		
-Vehicle		1,831,160.00
-Office Equipment		159,570.90
-Computers		966,387.32
-Airconditioners		1,255,925.19
-Machinary & Equipments		309,490.65
-Audio & Video Visual		209,470.25
-Furniture & Fittings		589,122.00
Acc.Amortisation on Soft ware		32,230.82
Welfare Payable		477,072.00
Health camp Payable		19,000.00
Empowenment Payable		22,202.00
Stationaries Payable		4,000.00
Advertising & Promotion Payable		12,075.00
Other Payable		48,550.42
Scholership Programe Payable		283,353.21
Staff Gratutity Provission		608,116.00
Water & Electricity Payable		15,053.45
Audit Fee Payable		186,300.00
Overtime & Holiday Pay Payable		16,275.80
Telephone Payable		26,345.30
Legal aid Payable		335,000.00
Retaintion 5%		62,165.00
Provission for web base system		390,000.00
Cummulated Fund		409,698,282.41
Shrama Vasana Lotary Income		51,766,720.00
Assets Maintance & Repair	27,925.40	
Bank Charges	1,760.19	
Audit fee	245,000.00	
Telephone Charges	273,991.76	
Postage	50,974.99	

Final Account 2018

"Shrama Vasana Fund"No 97, Jawaththa Road, Colombo 05

Water & Electricity Charges	102,467.16	
Office Maintance & Repair	13,505.00	
Depreciation -Vehicle	923,900.00	
-Office Equipment	26,101.54	
-Computers	403,440.23	
-Airconditioners	255,965.00	
-Machinary & Equipments	84,304.00	
-Audio & Video Visual	145,121.34	
-Furniture & Fittings	152,444.59	
Amortisation on Soft ware	9,238.36	
Transport	26,425.00	
Fuel	67,426.00	
Other Service	432,658.89	
Vehicle Maintance & Repair	436,032.60	
Practical Trainee Allowance	235,000.00	
Allowance for Directors	518,000.00	
Allowance for Chairman	209,274.00	
Allowance for Board Secretary	6,000.00	
Allowance for Internal Auditor	60,000.00	
Professional Allowance	132,000.00	
Staff Salaries	5,201,661.76	
E.P.F.	1,431,472.15	
E.T.F.	214,720.82	
Staff Gratutity	608,116.00	
Cost of Living Allowance	1,394,690.32	
Other Allowance	222,040.00	
Staff welfare	295,594.36	
Overtime & Holiday pay	463,726.59	
others	44,632.00	
Sundry Expence	25,354.00	
Refreshment & Other	192,933.00	
Entertainment	84,975.50	
Stationaries	471,405.85	
Domestic Travelling & Sub	143,973.50	
Productivity impro.appraisal	363,287.40	
Artificial Legs & limbs	2,479,803.00	
Health camp Expences	4,965,408.89	
Empowerment Expence	2,284,659.66	
Worker Awareness	1,168,907.00	
Welfare Programe Expence	7,874,648.37	
Medical Assistant Programme	212,147.50	
Techinical Education Programe Expence	10,000.00	
Legal aid Pograme Expence	311,923.52	
Legal assistance for appeals	90,000.00	
Scholership Programe Expence	3,891,722.49	
Lottery sale Public Awarness /TV	2,723,050.20	
Award Ceremony	1,696,079.71	
Training of Staff	297,750.00	
Other Income		224,347.70
Interest of Diss.Loan		34,996.90
Repo Investment Interest		110,766.23
Fixed Deposit Interest Income		11,104,892.32
	480,798,870.87	480,798,870.87

Final Account 2018

"Shrama Vasana Fund"No 97, Jawaththa Road, Colombo 05

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ඊඩබ්/ඒ/එස්වීඑෆ්/1/18 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 මැයි 31 දින.

සභාපති,

ශ්‍රම වාසනා අරමුදල.

ශ්‍රම වාසනා අරමුදලේ **2018** දෙසැම්බර් **31** දිනට අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **12** වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.ඒ.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත :- 1. ලේකම්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එල්ඊඩබ්/ ඒ /එස්විඑෆ් /1 /18 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2019 මැයි 31දින

සභාපති,

ග්‍රම වාසනා අරමුදල.

ග්‍රම වාසනා අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය කළ මතය

ග්‍රම වාසනා අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ නත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ප්‍රමාණාත්මක ගිණුම්කරණ දෝෂ

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ 5(1) වගන්තිය ප්‍රකාරව වර්ෂ 05 කට වඩා වැඩි සේවා කාලයක් සහිත සේවකයින් සඳහා සේවාව අවසන් වන දින සිට දින 30 ක කාලයක් තුල සේවක පාරිතෝෂික ගෙවිය යුතු බව දක්වා ඇත. කම්කරු කොමසාරිස්වරයාගේ අංක වී/123 දරන දෙපාර්තමේන්තු වක්‍රලේඛය III කොටසේ පාරිතෝෂික ගෙවීමේදී අදාල කරගතයුතු දීමනා සඳහන් කර නිබුණද අරමුදල විසින් 2018 වර්ෂය සඳහා සේවකයන් 04 දෙනෙකු වෙත පාරිතෝෂික වෙන් කිරීම් ගැලපීම් කිරීමේදී මූලික වැටුප පමණක් සැලකිල්ලට ගෙන තිබූ අතර ඒ හේතුවෙන් පාරිතෝෂික වෙන් කිරීම් මුදල රු.140,400 කින් අඩුවෙන් නිරූපණය කර තිබුණි.

(ii) මූල්‍ය තත්ව ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ පරිගණක මිලදී ගැනීම් ලෙස රු. 1,300,800 ක මුදලක් පෙන්නුම් කලද වර්ෂයේ මිලදී ගැනීම් රු. 751,800 ක් පමණක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) ගිණුම්කරණ ප්‍රමිතීන්වලින් බැහැරවීම

(i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

- ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 49 වගන්තිය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම් අයිතමය අයත්වන වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කලයුතු බවට දක්වා ඇතත් ඊට පටහැනිව අරමුදල විසින් 2018 වර්ෂය තුලදී රු.211,700 කට වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදුකර නිබුණි.

- වත්කම් පන්ති 3 ක් යටතේ වන අයිතමයන් 14 ක් 2018 නොවැම්බර් 30 දින ප්‍රත්‍යාගණනය කර තිබූ අතර, ඉන් ලද ප්‍රත්‍යාගණන ලාභය රු. 211,700 ක් විය. එම ප්‍රත්‍යාගණන ලාභය සමුච්චිත අරමුදලට බැර කිරීම් සිදුකල යුතු වුවත් එය ලාභාලාභ ගිණුමේ වෙනත් ආදායම් ලෙසට ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර. 07 හි 55 වගන්තිය ප්‍රකාරව අරමුදල කටයුතු කර නොතිබුණි.

(ii) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

- සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 19,238,084 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී වර්ෂයේ අතිරික්තය ලෙස රු.17,576,743 ක් ලෙස ගෙන නිබුණි.

- සමාලෝචිත වර්ෂය තුල මුදලින් ලද ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. 14,704,198 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ලද ස්ථාවර තැන්පතු පොළිය ලෙස රු. 11,104,892 ක් දක්වා නිබුණි.

- ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වූ මුදල් ප්‍රවාහය තුල ආයතනයේ වෙබ් අඩවිය සංවර්ධනය සඳහා කරන ලද ආයෝජනය ලෙස රු. 685,000 ක මුදලක් මුදල් ගලායෑම් ලෙස නිරූපණය වුවද, එම වටිනාකම තුල මුදලින් සිදු නොවූ ප්‍රතිපාදන වෙන් කිරීම් රු. 390,000 ක් අන්තර්ගත විය.

- පර්යේෂණ හා සංවර්ධන වියදම, මෘදුකංග සංවර්ධනය හා කාර්යමණ්ඩල පුහුණුව සඳහා පිළිවෙලින් රු. 295,175, රු. 549,000 සහ රු. 225,490 ක මුදලක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලාඒම් ලෙස දක්වා තිබුණද, එම වටිනාකම් සමාලෝචිත වර්ෂයේදී මුදලින් දරා නොතිබුණි.

(iii) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03**

පෙර වර්ෂයට අදාලව ප්‍රවර්ථන වර්ෂයේ ගිණුමෙහි ගැළපීම් කරන ලද රු. 1,661,340 ක් වටිනාකම වූ ගනුදෙනු හා සිද්ධීන්ට අදාලව ශ්‍රී.ල.රා.අ.ගි. ප්‍රමිත අංක 03 හි වගන්ති අංක 47, 50, 54 (අ), (ආ), (ඇ) වලින් දක්වා ඇති මගපෙන්වීම් වලට යටත්ව මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කිරීම් කර නොතිබුණි.

(iv) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08**

2016 වර්ෂයේ සේවයෙන් ඉවත් කල නිලධාරීන් දෙදෙනෙකු විසින් අරමුදලට විරුද්ධව කම්කරු උසාවියට කරන ලද පැමිණිල්ලක් සමාලෝචිත වර්ෂය වන විට විභාග වෙමින් පැවතුණද මූල්‍ය ප්‍රකාශන තුල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 හි 100 වැනි වගන්තිය ප්‍රකාරව ඒ සම්බන්ධව හෙලිදරව් කර නොතිබුණි.

(ඇ) **විගණනයට සාක්ෂි නොමැති වීම**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2017.09.14 දිනැති අංක 7/6/2017 දරන අධ්‍යක්ෂක මණ්ඩල වාර්තාවට අනුව රු. 1,691,750 ක වියදමක් අනුමත කර තිබූ වෘත්තීය අනතුරු හේතුවෙන් දෙමාපියන් මියගිය සිසුන්ගේ ශිෂ්‍යත්ව වැඩසටහනේදී සිසුන් 50 දෙනෙකුට ශිෂ්‍යත්ව ලබාදී තිබුණද, එම තොරතුරු තහවුරු කර ගැනීමට සාක්ෂි ඉදිරිපත් නොවුණි.

(ii) 2018 අගෝස්තු 09 දින මධ්‍යම පළාතේ පවත්වා තිබූ අක්ෂි වෛද්‍ය කඳවුරේදී තෝරාගත් ප්‍රතිලාභීන් 421 දෙනෙකුට ඇස් කණ්නාඩි බෙදා දුන් බවට ලිඛිත සනාථන ඉදිරිපත් නොවුණි.

(iii) පනතේ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී දරන ලද රු.1,948,409 කට අදාල විධිමත් සනාථන විගණනය වෙත ඉදිරිපත් නොවුනි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධ වී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකාරකම් කර ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

3.1 මානව සම්පත් කළමනාකරණය

අරමුදල විසින් මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර තිබුණද එය, 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 හා 3 ඡේද පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර, එම චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව කාර්ය මණ්ඩල නිපුණතා අවශ්‍යතාවයන් හඳුනාගෙන නොතිබුණි.

3.2 මුදල් කළමනාකරණය

2018 ජනවාරි 01 දිනට අරමුදල සතුව රු. මිලියන 103 ක ස්ථාවර තැන්පතු හා රු. 557,562 ක බැංකු ශේෂයක් පැවතුණද, සමාලෝචිත වර්ෂයේ අයවැය ප්‍රකාරව වර්ෂයේ වියදම් රු. 58,900,000 ක් වූ අතර, භාණ්ඩාගාරයෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 30 ක මුදලක් ලබාගෙන තිබුණි. නමුත් එලෙස ලබාගත් මුදල් සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන්වලට භාවිතා නොකර ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. එම මිලියන 30 න් රු. මිලියන 20 ක් මහජන බැංකුවේ සියයට 11 සහ සියයට 10.5 පොළී අනුපාත යටතේ ආයෝජනය කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති